පහළොස් හැවිරිදි පාසැල් සිසුවියන් දෙදෙනෙකු රවටා "අඹු කමට" ගෙන ගිය බවට පුවතක් ලංකාදීප (06/15) පුවත්පතේ පළවී තිබිණි. ඒ "වෙළඳාමේ ඇවිත් සිසුවියන් දෙදෙනෙකු අඹුකමට ගෙන ගිහින්" යන සිරස්තලය සමගිනි. මෙහිදී ලිංගික අපයෝජනයක් සිදුවී ඇතිද යන්න පුවත් අන්තර්ගතය තුළ හෝ නොකියවෙන අතර, සිරස්තලයේ දැක්වෙන "අඹු කමට ගෙන ගිහින්" යන්න දැක්වී ඇත්තේ වචනාර්ථයෙන්ම නම්, මෙහි ලිංගික අපයෝජනයක් සිදුව ඇති බවක් උපකල්පනය කිරීමට හැක. කෙසේ වෙතත්, බාලවයස්කාර දැරියන් ඔවුන්ගේ නීත්‍යානුකූල භාරකාරත්වයේ අවසරයක් නැතිව රැගෙන යාම නීතිය ඉදිරියේ වරදක් බව පැහැදිලිය. යම් හෙයකින් ලිංගික සබඳතාවයන් ඇතිවී තිබේ නම්, එය බාලවයස්කාරිනියන්ගේ කැමැත්තෙන් සිදුවුවත් "ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක්" වන බව නීතියේ සඳහන් වේ. එවැනි අවස්ථාවකදී බාලවයස්කරුගේ කැමැත්ත සැබවින්ම අදාළ නොවේ. එයද නීතියෙන් දඬුවම් ලැබෙනා වරදකි.
එම පසුතලයේ සිට බලනා විට, මෙම වරදෙහි බරපතළ බව මෙම සිරස්තලයෙන් ආවරණය වී තිබේ යැයි ඔබ සිතන්නේද? එම සිදුවීම වඩාත් සැහැල්ලු ආකාරයකින් ඉදිරිපත් කිරීම ඔස්සේ, එවැනි වරදක බරපතළ භාවය සමාජයට සන්නිවේදනය වන්නේ කෙසේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaNews #Lankadeepa